**චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය - 2016**

---

චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතේ 11(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථා භාරයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවෙහි දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2016 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථා භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 21,221 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 705,128 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 683,907 කින් වර්ධනය වී තිබුණි. අනෙකුත් ආදායම් රු. 269,822 කින් සහ සංස්ථා දායකත්වය රු. 300,000 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

------------------

1986 අංක 03 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථාභාර පනත ප්‍රකාරව අරමුදලේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

(අ) චිත්‍රපට කලාකරුවන්ට හා කාර්මිකයන්ට දායක විශ්‍රාම වැටුප් ක්‍රම සකස් කිරීම, යහ සාධක අරමුදල්, ඉතිරි කිරීමේ අරමුදල්, ඉතිරි කිරීමේ හෝ සකසුරුවම් සමිති සහ වෙනත් සමාන යෝජනා ක්‍රම පිහිටුවීම;

(ආ) විශ්‍රාම වැටුපක්, ණයක්, දීමනාවක්, නිවාස පහසුකමක් හෝ වෙනත් සමාන ප්‍රතිලාභයක් ඔහු වෙත පිරිනැමීම;

(ඇ) කායික හෝ මානසික අබලතාවකට පත්ව සිය වෘත්තියෙහි යෙදීමට නොහැකිව සිටී නම්, යම් මුදල් ආධාරයක් පිරිනැමීම, අවමංගල්‍ය වියදම් වෙනුවෙන් කාර්මිකයාගේ වැන්දඹුවට, දෙමාපියන්ගෙන් කෙනෙකුට හෝ බාලවයස්කාර දරුවකුට මුදල් හෝ වෙනත් ආධාර පිරිනැමීම සංස්ථා භාරයේ ප්‍රධාන අරමුණ විය.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ සංස්ථා භාරයේ ආදායම එහි ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමටවත් ප්‍රමාණවත් මට්ටමක නොතිබූ හෙයින් ඉදිරියේදී එහි අරමුණු ඉටුකරගැනීමේ දී ඒ සඳහා වන අරමුදල් සපයාගැනීමේ අවදානමක් පවතින බැවින් විකල්ප මූල්‍ය සම්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමු විය යුතු බව නිරීක්ෂණය විය.

(ii) 1998 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ වර්ෂ 18 ක් තුළදී චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා විශ්‍රාම වැටුප්, වෛද්‍යාධාර හා අවමංගල්‍යාධාර වශයෙන් එකතුව රු. 24,339,980 ක් ප්‍රදානය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් වශයෙන් රු. 1,374,000 ක් ගෙවා තිබුණි. එහෙත් 2016 දෙසැම්බර් 31 දින තෙක්ම චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ කටයුතු සඳහා අදාළ අමාත්‍යවරයා විසින් භාරකාර මණ්ඩලයක් පත් නොකිරීම නිසා ප්‍රතිලාභීන් වෙනුවෙන් ඉතිරිකිරීමේ අරමුදල් පිහිටුවීම, සකසුරුවම් සමිති ඇති කිරීම, ණය ලබාදීම, නිවාස පහසුකම් ලබාදීම ආදී අරමුණු ඉටුකර ගැනීම නොහැකිවී තිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයින් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතෙහි 3.1 සහ 3.2 ඡේද අනුව භාරයෙහි කළමනාකරණය සහ පාලනය සඳහා භාරකාර මණ්ඩලයක් පත්කළ යුතු වුවත් 2013 වර්ෂයේ සිට භාරකාර මණ්ඩලයක් පත්කර නොතිබුණි. ඒ හේතුවෙන් භාරයේ කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) විශ්‍රාම ප්‍රතිලාභ ලබන කලාකරුවෙකු හෝ කාර්මිකයෙකු මියගිය විට ඉන් ඇතිවන පුරප්පාඩුව සඳහා පොරොත්තු ලේඛනයෙන් සුදුසුකම් ලබන විශ්‍රාමලාභියෙකු තෝරාගැනීම යාවත්කාලීනව සිදු නොවීම.

(ii) අරමුදලේ සාමාජිකයෙකු ජීවත්ව සිටීද යන්න පිළිබඳව නිසි තහවුරුකර ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව මාස්පතා විශ්‍රාම දීමනාව බැංකුගත කරනු ලබන බව නිරීක්ෂණය විය. තවද බැංකුගත නොකර මුදල් ලබා ගන්නා එක් විශ්‍රාම වැටුප් ලාභියෙකු රු.36,000 ක් වූ මාස 18 ක විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා ඉදිරිපත් වී නොතිබූ අතර අදාළ මුදල් හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් වෙන්කිරීමේ ගිණුමකට බැරකර තිබුණි. එහෙත් විශ්‍රාම දීමනාව ලබා නොගැනීමට හේතු සොයාබලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මෙතෙක් සිදුකර නොතිබුණි.

(iii) භාරය මගින් ලබාදෙන ප්‍රතිලාභ පිළිබඳව කලාකරුවන් හා කාර්මිකයින් දැනුවත් කිරීමට ගෙනඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවීම නිසා නව ප්‍රතිලාභීන් අරමුදලට දායක කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) පනතෙහි 6 .2 (අ) අනුව සුදුසු ක්‍රම උපයෝගී කරගෙන අරමුදල් උපයා ගැනීමට හැකියාව තිබුණ ද එවැනි ඵලදායී වැඩසටහනක් හෝ ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

2014 වර්ෂයේ ජනවාරි සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවීම් කිරීම සඳහා තෝරාගත් ආකාරය නිශ්චිතව සඳහන් නොමැති විශ්‍රාම වැටුප්ලාභී කලාකරුවන් 15 දෙනෙකුට එක් අයකුට මාසයකට රු.2000 බැගින් එකතුව රු. 1,080,000 ක් ගෙවා තිබුණි. භාරකාර මණ්ඩලය පත්කර නොමැති නිසා මේ සඳහා පනතේ 6 (2) (1) (ඇ) වගන්තිය ප්‍රකාර භාර මණ්ඩල අනුමැතිය රහිතව ගෙවීම් සිදුකර තිබුණි.

5. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

5.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛය අනුව අදාළ ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් ආයතනය විසින් 2016 වර්ෂයට අදාළ ගිණුම් විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2017 ජූලි 06 දින එනම් දින 128 ක ප්‍රමාදයකින් පසුවය.

5.2 **අභ්‍යන්තර විගණනය**

චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර භාරයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) විශ්‍රාම වැටුප් ගෙවීම් පාලනය | විශ්‍රාම වැටුප් ලාභීන් ජීවත් වන බව හඳුනා ගැනීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයක් නොවීම සහ පොරොත්තු ලේඛනය යාවත්කාලීන නොකිරීම. |
| (ආ) මූල්‍ය කළමනාකරණය | විශ්‍රාම වැටුප් ගෙවීම සහ වෛද්‍යාධාර ලබාදීමට ප්‍රමාණවත් වන පරිදි අරමුදල වර්ධනය කර නොගැනීම. |